(01)

අමාත්‍ය / அமைச்சர் / Minister – 2326732

ලේකම් / செயலாளர் / Secretary – 2399735, 2399673

මගේ අංකය / எனது இல. / My No – PL/13/IA/A&M/2017-111

ඔබේ අංකය / உமது இல. / Your No –

දිනය / திகதி / Date – 2017.11.28

# පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
## மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Provincial Councils and Local Government

330, යූනියන් පෙදෙස, කොළඹ 02,/ 330, யூனியன் பிளேஸ், கொழும்பு 02 / 330, Union Place, Colombo 02

අභ්‍යන්තර චක්‍රලේඛ : 04/2017

අභ්‍යන්තර විගණන අංශය

සියළුම අංශ ප්‍රධානීන්,

සියළුම ව්‍යාපෘති අධ්‍යක්ෂකවරු,

අධ්‍යක්ෂ - දේශීය ණය සහ සංවර්ධන අරමුදල,

අධ්‍යක්ෂ - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය,

**<u>කාර්යක්ෂම හා ඵලදායි අභ්‍යන්තර පාලන ව්‍යුහයක් ස්ථාපිත කිරීම</u>**

අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් 2017.10.14 දින නිකුත් කර ඇති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙන් පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

01.ඔබ වෙත ලැබෙන අභ්‍යන්තර හා විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදී නියමිත ලිත් දිනට අදාළ පිළිතුරු ලබා දීමට කටයුතු කිරීම.

02.නියමිත ලිත් දිනට පිළිතුරු ලබා දීමට ඔබ අපොහොසත් වන්නේ නම් ඒ සඳහා ලිඛිතව දැනුම් දී ලිත් දිනය දීර්ඝ කර ගැනීමට කටයුතු කිරීම.

03.විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේදී යොමු කර ඇති ප්‍රශ්නය පිළිබඳ අවබෝධ කර ගෙන ඉලක්කගත පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම.

04. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම සම්බන්ධයෙන් 2018 වසරට අදාලව ක්‍රියාත්මක වැඩසටහන සඳහා වාර්ෂිකව ලකුණු ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වන බැවින් එහි ඇති නිර්ණායක සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කර සෑම කාර්තුවකදීම නොපමාව ක්‍රියාමාර්ග ගතයුතු අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී එහි ප්‍රගතියද සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවේ.(ඇමුණුම 1 විශ්ලේෂණය කිරීමෙන් අදාල ඉලක්ක හඳුනාගත හැකිය)

එච්.ටී.කමල් පත්මසිරි,
ලේකම්,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.



| කාර්යාලය / அலுவலகம் / Office | අතිරේක ලේකම් (පාලන හා මුදල්) / மேலதிகச் செயலாளர் (நிர்வாக.,நிதி) / Addl.Sec (Admin & Finance) | අතිරේක ලේකම් (පළාත් පාලන සහ පළාත් සභා) / மேலதிகச் செயலாளர்(உள்ளூரா.,மாகாண சபைகள்) / Addl.Sec. (Local Govt. & Provin.Councils) | අතිරේක ලේකම් (සංවර්ධන) / மேலதிகச் செயலாளர் (அபி.) / Addl.Sec. (Development) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant |
|---|---|---|---|---|
| Tel: 2305326/7 | Tel: 2347528 | Tel: 2326106 | Tel: 2303722 | Tel: 2345973 |
| Fax: 2347529 | Fax: 2347529 | Fax: 2324142 | Fax: 2303724 | Fax: 2347532 |